සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 1 |

සැලකිය යුතුයි.

(I) සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.

(II) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(III) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

1. සන්නිවේදනයේ දී ඇතිවන බාධක අවම කර ගැනීමේ හැකියාවක් ඇති සන්නිවේදන වර්ගය වන්නේ.
   1) සමූහ සන්නිවේදනය.
   2) අවිධිමත් සන්නිවේදනය.
   3) අන්තර් පුද්ගල සන්නිවේදනය.
   4) අවාචිකඅවිධිමත් සන්නිවේදනය.

2. වර්තමානයේ බහුකාර්යය හා බහුමාධ්‍ය උපකරණක් බවට පත්ව ඇති උපකරණය වන්නේ,
   1) විද්‍යුත් තැපැල.
   2) ෆැක්ස් යන්ත්‍රය
   3) ස්ථාවර දුරකථනය
   4) ජංගම දුරකථනය

3. රටක පුරවැසිභාවය යනුවෙන් හඳුන්වන්නේ,
   1) රටකට අයිති සියලුම ජනගහනයයි.
   2) රටක ජීවත්වන සියලුම ජනගහනයයි.
   3) යම් රටක ඡන්ද බලය හිමි නීත්‍යානුකූලව පදිංචි වී සිටින්නන්ය .
   4) රටක ආර්ථිකය නංවාලීමට උරදෙන ජනතාවයි .

4. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ විශේෂතා වලට මින් අයත් නොවන්නේ ,
   1) ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය දීම .
   2) තම දැක්මට අනුව ක්‍රියාකිරීම.
   3) පුද්ගල තීරණ ගැනීමේ කාර්යය සිදුවීම .
   4) ඇතැම් අවස්ථාවල බාධක ඇතිවිය හැකිවීම.

5. සදොස් වැකිය තෝරන්න
   1) සියලු ගැටුම් සමාජයට අහිතකරයි.
   2) සමාජය සංවර්ධනය වන්නේ ගැටුම් නිසයි.
   3) මිනිසාගේ ස්වභාවය ගැටුම් වලට නැඹුරු වීමය.
   4) ගැටුම් නිසා සමාජ සාමය බිඳ වැටේ.

6. ප්‍රාථමික මානවයා සිය හැඟීම් හා අත්දැකීම් ප්‍රකාශ කිරීම සඳහා යොදාගත් සාක්ෂි හමුවන සන්නිවේදන ස්වරූපය වන්නේ,
   1) වාචික සන්නිවේදනය.
   2) අවාචික සන්නිවේදනය.
   3) ලිඛිත සන්නිවේදනය.
   4) දෘශ්‍ය සන්නිවේදනය.

7. භාෂාව මිනිසා විසින්ම ඔහුගේ අවශ්‍යතාව මත නිර්මාණය කරගත්තකි. මානවයාගේ කාර්යයන් පහසු කරවන භාෂාවේ කාර්යයක් නොවන්නේ
   1) සිතීම විධිමත් කිරීමයි.
   2) දැනුම සංරක්ෂණය කිරීමයි.
   3) කාලය සන්නිවේදනයයි.
   4) සාවද්‍ය අදහස් හුවමාරු කිරීමයි.

8. අවාචික සන්නිවේදන ක්‍රම පමණක් ඇතුලත් වරණය තෝරන්න.
   1) හිසවැනීම, අත්පුඩි ගැසීම, මුහුණේ ඉරියව්.
   2) ජන නැටුම්, පූජා ක්‍රම , ජනකවි.
   3) අතවැනීම, ගුහා චිත්‍ර, ගීත ගායනය.
   4) බෙරහඬ , ඡායාරූප , නිවේදනය කිරීම

9. සුරේන්ද්‍ර තනිවම කල්පනා කරමින් සිටියේ හෙට පැවැත්වෙන චිත්‍ර ප්‍රදර්ශනය ගැනයි. එම මොහොතේ මිතුරාගෙන් ලැබුණු දුරකථන ඇමතුම නිසා චිත්‍ර ප්‍රදර්ශනයට යාමට මිතුරා සමග සාකච්ඡා කරගත්තේය.චිත්‍ර ප්‍රදර්ශනය ගැන දැනුවත් කිරීමක් රූපවාහිනියෙන්ද ප්‍රචාරය කෙරිණි. මෙහි ඇති සන්නිවේදන වර්ග පිළිවෙළින් දැක්වූ විට,
   1) අන්තර්පුද්ගල සන්නිවේදනය, පුද්ගලාන්තර සන්නිවේදනය , ජන සන්නිවේදනය .
   2) ජන සන්නිවේදනය, පුද්ගලාන්තර සන්නිවේදනය, ශ්‍රව්‍ය සන්නිවේදනය .
   3) සමූහ සන්නිවේදනය, ජන සන්නිවේදනය , අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය.
   4) පුද්ගලාන්තර සන්නිවේදනය, ජන සන්නිවේදනය, අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය.

10. කෙනකුගේ පංචේන්ද්‍රිය මගින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම හඳුන්වන්නේ.
   1) දොරටුපාල සංකල්පය ලෙසයි.
   2) සන්නිවේදන බාධක ලෙසයි.
   3) සංජානනය ලෙසයි
   4) ප්‍රතිපෝෂණය ලෙසයි.

11. කෙනෙකුගේ සන්නිවේදන ක්‍රියාවලිය ආරම්භ වන්නේ
   1) අන්තර්පුද්ගල සන්නිවේදනයෙනි
   2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයෙනි
   3) ද්වි මාර්ගික සන්නිවේදනයෙනි
   4) සමූහ සන්නිවේදනයෙනි

12. භාෂා ද්විරූපතාව යනු.
   1) වාචික හා ලිඛිත ලෙස භාෂා පැවතීමයි.
   2) භාෂාවේ ලක්ෂණ දෙකක් පැවතීමයි.
   3) භාෂාවකට අක්ෂර දෙවර්ගයක් තිබීමයි
   4) භාෂා දෙකක් පැවතීමයි.

13. ලිපියක මුද්දරයක් මුද්‍රණය කිරීම සඳහා භාවිතා කරන යන්ත්‍රය වන්නේ,
   1) දින මුද්‍රා යන්ත්‍රය.
   2) තැපැල් මුද්‍රා යන්ත්‍රය.
   3) නිල මුද්‍රා යන්ත්‍රය.
   4) මුදල් සටහන් යන්ත්‍රය.

14. අන්තර්ජාල සෙවුම් යන්ත්‍රයක් නොවන්නේ,
   1) Google.
   2) Internet Explore.
   3) Twitter.
   4) Firefox.

15. ප්‍රක්ෂේපණය කල නොහැකි මාධ්‍ය උපකරණය වන්නේ කුමක්ද ?
   1) ජාතික ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
   2) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
   3) අන්තර් ක්‍රියාකාරී පුවරුව.
   4) කාන්දම් ලැල්ලය.

16. විනිවිදක රූපරාමු භාවිතා කරන ප්‍රක්ෂේපණ යන්ත්‍රය වන්නේ ?
   1) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
   2) ඕවර් හෙඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
   3) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
   4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය.

17. මහමග සිදුවූ මංකොල්ලකෑමක් පිළිබඳ තොරතුරු පොලිසියට ලබා ගත හැකිවූ මාධ්‍ය උපකරණය වූයේ
   1) සංවෘත රූපවාහිනී කැමරාව.
   2) අන්තර්ජාල පරිගණකය.
   3) අන්තර්ජාල පරිගණක කැමරාව.
   4) රූපවාහිනී දුර කැමරාව.

18. ඡායාරූප ශිල්පීය වෘත්තිකයෙකු සතුවිය යුතු ලක්ෂණයක් නොවන්නේ
   1) ඡායාරූපකරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුම.
   2) නිර්මාණශීලි වීම.
   3) නව තාක්ෂණය හා අත්වැල් බැඳ නොගැනීම
   4) ආචාරශීලි වීම.

19. කාච විවරයේ හා ද්වාරයේ පිහිටීම නිසි පරිදි සකස්කොට ආලෝකය පාලනය කිරීම සහ ප්‍රතිබිම්බය සටහන් කර ගැනීම සිදුකරනු ලබන්නේ
   1) කැමරා කාචය මගිනි.
   2) ද්වාරය මගිනි.
   3) නාභිගත කිරීම මගිනි.
   4) අනාවරණය කිරීම මගිනි.

20. ප්‍රතිපෝෂණය යනුවෙන් හැඳින්වෙන්නේ
   1) ඒකමාර්ගික සන්නිවේදන ක්‍රියාවලියයි.
   2) සංදේශයක් මාධ්‍ය හරහා ගමන් කිරීමයි.
   3) සන්නිවේදකයාගෙන් ග්‍රාහකයාට සංදේශය ලැබීමයි.
   4) ග්‍රාහක ප්‍රතිචාර සන්නිවේදකයා වෙත ලැබීමයි.

21. ඡායාරූපයක් ගැනීමේදී අනුගමනය කළයුතු පියවර නිවැරදිව සඳහන් වන වරණය තෝරන්න.
   1) නාභිගත කිරීම , මානනය, අනාවරණය.
   2) මානනය, නාභිගත කිරීම, අනාවරණය.
   3) අනාවරණය, නාභිගත කිරීම , මානනය.
   4) මානනය, අනාවරණය, නාභිගත කිරීම.

22. අර්ධකාලින වශයෙන් යම් ජනමාධ්‍ය ආයතනයකට තම සේවාව වෙනුවෙන් පමණක් ගෙවීම් ලබන මාධ්‍ය ශ්‍රමිකයන් හඳුන්වනු ලබන්නේ.
   1) ප්‍රාදේශීය මාධ්‍යවේදීන් නමිනි.
   2) මාණ්ඩලික මාධ්‍යවේදීන් නමිනි.
   3) පුරවැසි මාධ්‍යවේදීන් නමිනි.
   4) ඉහත සියලු දෙනාම නොවේ.

23. ජනමාධ්‍ය මගින් සමාජය නියෝජනය වන්නේ විවිධාකරයෙනි. ඒ අතර සමාජීය නියෝජනයට අයත් වන්නේ , පහත සඳහන් කවර කාණ්ඩයද ?
   1) වැඩලෝකය , විවිධ වෘත්තීන්, වෙළඳපොල , සංවර්ධනාත්මක චින්තනය .
   2) පවුල, ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය , පුරවැසිභාවය
   3) ආගම, සදාචාරය හා සාරධර්ම, සමාජ ප්‍රතිරූපය , මානව ධර්මතා
   4) රසඥතාව, නිර්මාණාත්මක චින්තනය, විනෝදාත්මක කාර්යය , සමාජ විඥානය.

24. රාජ්‍ය මධ්‍ය ආයතනයක හෝ සීමාසහිත පෞද්ගලික සමාගමක හෝ කලමනාකරණ ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ,

1) සභාපතිවරයා විසිනි.
2) ප්‍රධාන විධායක විසිනි.
3) අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.
4) මාධ්‍යවේදීන් විසිනි.

25. ගුවන්විදුලි වැඩසටහනක් නිර්මාණාත්මකව නිමකිරීම සඳහා අවශ්‍ය සියල්ල සැලසුම්කර සපායාදෙන තැනැත්තා,

1) අධ්‍යක්ෂකවරයා.
2) වේශ නිරූපණ ශිල්පියා.
3) සංස්කාරකවරයා.
4) නිෂ්පාදකවරයා.

26. අභිසාරිතාව යනු,

1) එකට හමුවීමයි.
2) එකිනෙකට ගැටීමයි.
3) හමුවී වෙන්වීමයි.
4) වෙන්වක්‍රියාකිරීමය

27. පැලියොලිතික් යුගයේදී මානවයා බහුලව ජවත් වූයේ,

1) වනාන්තරේ ගුහාවලයි.
2) තම නායකයට අයත් නිවස තුලයි
3) ග්‍රාමීය ප්‍රදේශවලයි
4) නගරාශ්‍රිතවයි

28. පණිවුඩ හුවමාරු ක්‍රමයේදී පරවියන් යොදා ගැනීම සිදුකරන ලද්දේ,

1) දෙවන ලෝක යුද්ධ සමයේදීය.
2) පළමු ලෝක යුද්ධ සමයේදීය.
3) රුසියානු විප්ලවය පැවති සමයේදීය.
4) ප්‍රංශ විප්ලවය පැවති සමයේදීය.

29. පේජරය නමැති සන්නිවේදනය උපකරණය වර්තමානයේදී භාවිතයෙන් ගිලිහීමට බලපාන ප්‍රධාන හේතුවක් වන්නේ

1) එය මිල අධිකවීමයි.
2) භාවිතයේ ඇති අපහසුවයි.
3) අන්තර්ජාලයේ ව්‍යාප්තියයි.
4) ජංගම දුරකතනයේ ව්‍යාප්තියයි.

30. යහපත් පවුල් පරිසරයක් ගොඩනගන පවුලකට උචිත නොවන්නේ

1) මනා පිළිගැනීමක් හා විශ්වාසය ගොඩනැගීමයි.
2) ස්වයං අනාවරණය හා කැපවීමයි.
3) තම පවුලේ තුල නැති වෙනත් පවුල් තුල ඇති ගුණාංග අගය කිරීමයි
4) සෙනෙහස ආචාරශිලිත්වය ඇති කිරීමයි.

31. පරිකල්පනය වඩාත් වැදගත් වන්නේ,

1) රූපවාහිනී ප්‍රේක්ෂකයාටයි.
2) පුවත්පත් පාඨකයටයි.
3) ගුවන්විදුලි ශ්‍රාවකයටයි.
4) අන්තර්ජාලයෙ හැසිරෙන්නාටයි.

32. සම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යන් පමණක් ඇතුලත් වන්නේ

1) ගස්වල එල්ලූ කොළ අතු, සත්ව නාද , සංගීතය.
2) ගින්දර , සත්ව නාද , බෙර හඬ , ස්වභාවික ශබ්ද.
3) හුව , බෙර හඬ , සංඥා නලා , සංගීතය.
4) දුම , සංගීතය , විවිධ සංඥා, ධාරා සටහන්.

33. දොරටුපාල සංකල්පය පිළිබඳව අවධානය යොමුවන්නේ

1) ජනසන්නිවේදනයේදී.
2) චිත්‍රපට පෙන්වීමේදී.
3) ටෙලිනාට්‍ය වලදී.
4) ගුවන්විදුලි නාට්‍යවලදී.

34. ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී සේවාව 1979 දී ආරම්භ විය. ඒම සේවාව මින් කුමක්ද ?
   1) ශ්‍රී ලංකා රූපවාහිනී සේවාව.
   2) ස්වාධීන රූපවාහිනී සේවාව.
   3) ස්වර්ණවාහිනී රූපවාහිනී සේවාව.
   4) දෙරණ රූපවාහිනී සේවාව.

35. පහත දැක්වෙන පුවත්පත් අතරින් කතෘ හිමිකාරිත්වය අනුපිළිවෙලින් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න

| | |
|---|---|
| 1) ජී.ඩී . පැලිස් අප්පුහාමි | A - ඔබ්සර්වර් හා කොමර්ෂල් ඇඩ්වර්ටයිසර් |
| 2) එච්. එස්. පෙරේරා | B - උදය තාරකෙ |
| 3) ජී. ඇක්ලන්ඩ් ෆ්.ඩාර්ලි | C - දිනමිණ |
| 4) හෙන්‍රි මාර්ටින් හා සෙයිපෙයිෂන් | D - කවට කථකයා |

**1.) B,A,D,C** **2.) A,B,C,D** **3.) D,C,A,B** **4.) D,A,C,B**


36. ඩිජිටල් කැමරාවකින් ඡායාරූප ගැනීම සාමාන්‍ය කැමරාවකින් ඡායාරූප ලබා ගැනීමට වඩා විශ්වසනීය බව ගීතා පැවසුවාය මේ සඳහා අදාළ නොවන කරුණ වන්නේ.
   1) 12,24,36 ලෙස ඡායාරූප ප්‍රමාණයක් ගැනීමට ඇති හැකියාවයි.
   2) ඡායාරූප ලබාගෙන මුද්‍රණය කිරීමෙන් පසු ඒවා පැහැදිලිදැයි හඳුනාගැනීමට හැකිවීමයි.
   3) ඡායාරූපයක් ලබාගත් මොහොතේම එය නිරීක්ෂණය කළහැකි වීමයි.
   4) පරිගණකයක් හා සම්බන්ධ කල පසු ඒවා පහසුවෙන් නැරඹිය හැකිවීමයි.

37. සන්නිවේදනයේදී ග්‍රාහකස්ථානය
   1) තනි පුද්ගලයෙකි.
   2) තනි පුද්ගලයෙක් හෝ කණ්ඩායමකි.
   3) කණ්ඩායමක් හෝ ආයතනයකි.
   4) තනි පුද්ගලයෙක්, කණ්ඩායමක් හෝ ආයතනයකි.

38. ප්‍රධාන සන්නිවේදන බාධක වර්ග ලෙස සැලකෙන්නේ
   1) අර්ථබාධක හා පාරිසරික බාධක.
   2) තාක්ෂණික බාධක හා පාරිසරික බාධක.
   3) අර්ථබාධක හා මාධ්‍ය බාධක.
   4) ශාරීරික බාධක හා මනෝවිද්‍යාත්මක බාධක.

39. සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍යක් නොවන්නේ
   1) ගස්වල කැපුම් කට්ටා.
   2) චිත්‍ර.
   3) මාර්ග සංඥා.
   4) ගින්දර.

40. මෙම රූප සටහනෙන් දැක්වෙන අකෘතිය වන්නේ .



   1. දාම ආකෘතිය.
   2. රෝද ආකෘතිය.
   3. චක්‍රීය ආකෘතිය.
   4. වයි ආකෘතිය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | |
| විෂයය / பாடம் / Subject | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | II | |
| පැය / மணித்தியாலம் / Hours | 2 | |

සැලකිය යුතුයි:
**පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**
**පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 හිමිවන අතර අනිකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ**

1. එක්තරා පාසලක ඡායාරූප සංගමය විසින් දින පහක් පුරාඡායාරූප ප්‍රදර්ශනයක් පවත්වන ලදී. එය විවෘත කරන ලද්දේ එක්තරා විශ්ව විද්‍යාලයක ප්‍රතිබිම්බ කලා අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයා විසිනි.

1) මෙම ඡායාරූප ප්‍රදර්ශනය මගින් ඉටුවිය හැකි සන්නිවේදන අරමුණු දෙකක් නම් කරන්න.

2) ඉහත සඳහන් ඡායාරූප ප්‍රදර්ශනය අරමුණු කරගෙන, සන්නිවේදන ක්‍රියාවලියට අදාල මූලික අංග 4 ක් නම් කරන්න .

3) එම මූලික අංග වලට අදාල අනුරූප අවස්ථා කවරේද ?

4) ඡායාරූප ප්‍රදර්ශනය විවෘත කල අංශාධිපතිවරයා අදාල සිසුන් අගයමින් කථාවක් කළේය. මෙය අයත්වන සන්නිවේදන වර්ගය කුමක්ද ?

5) විවෘත කිරීමේ උත්සවයට සහභාගී වී සිටි ප්‍රේක්ෂක පිරිස අංශාධිපතිවරයාගේ කථාවට මනාලෙස සවන් දුන්නේ නම් එම කරුණ හැර හොඳ ශ්‍රාවකයකුගේ ලක්ෂණ දෙකක් නම් කරන්න.

6) ඡායාරූප තරඟයේ ජයග්‍රාහකයන්ට ලබාදෙන සහතික පත්‍රය මුද්‍රණය කල හැකි ලාභදායි මුද්‍රණ ක්‍රමවේදය කුමක්ද ?

7) ඡායාරූප අයත්වන්නේ කුමන සන්නිවේදන ස්වරූපයකටද?

8) ඡායාරූපයක ඇති වටිනාකම පිළිබඳව කරුණු දෙකක් නම් කරන්න.

9) ඡායාරූපයක් ගැනීමේදී කැමරා වර්ග කිහිපයක් භාවිතා කල හැකිය. ඉන් දෙකක් නම් කරන්න.

10) ඡායාරූපකරණයේදී සේයාපටල වර්ග කිහිපයක් හඳුනාගත හැකිය.එම සේයා පටල වර්ග දෙකක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

2. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය විෂය උගන්වන ගුරුතුමිය බහුමාධය ප්‍රක්ෂේපණ යන්ත්‍රය ආශ්‍රයෙන් සන්නිවේදනයේ ඉතිහාසය පිළිබඳ විස්තර කරමින් 10ශ්‍රේණියේ සිසුන්ට පාඩමක් විස්තර කළාය .

1) බහුමාධ්‍යයප්‍රක්ෂේපණ යන්ත්‍රය භාවිතා කිරීමේදී එයට සම්බන්ධ කල යුතු උපකරණය කුමක්ද ? (1)

2) බහුමාධ්‍යයප්‍රක්ෂේපණ යන්ත්‍රය භාවිතයෙන් ලැබෙන වාසි දෙකක් නම් කරන්න . (2)

3) විදුලිය විසන්ධිවීම නිසා බහුමාධය ප්‍රක්ෂේපණ යන්ත්‍රය කිහිප වරක් අක්‍රිය විය. මෙහිදී සිදුවූ බාධකය නම් කර එවැනි බාධක ඇතිවිය හැකි අවස්ථා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (3)

4) බහුමාධ්‍යයප්‍රක්ෂේපණ යන්ත්‍රය භාවිතා කිරීමෙන් සිදුකල ඉගැන්වීම් ක්‍රියාවලිය අයත්වන්නේ කවර සන්නිවේදන වර්ගයටද? එය නම් කර එහි විශේෂතා හතරක් පැහැදිලි කරන්න (4)

3. වර්තමානයේ රූපවාහිනී මාධ්‍ය තුල උසස් නිර්මාණ මෙන්ම අවර ගනයේ නිර්මාණද දක්නට ලැබේ

1) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ආරම්භ කල වර්ෂය. (1)

2) රූපවාහිනී වෙළඳ දැන්වීම් වලින් පාරිභෝගිකයාට ඇති වාසි 2ක් නම් කරන්න. (2)

3) ජනමාධ්‍ය ආයතනයක ප්‍රධාන කතෘ විසින් කෙරෙන කාර්ය කරුණු තුනක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (3)

4) පරිගණකය ඇසුරෙන් ලිපියක් සකස් කිරීමේ ප්‍රධාන පියවර කෙටියෙන් විස්තර කරන්න. (4)

4. පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය පිළිබඳ දැන්වීම, පාසලේ දැන්වීම් පුවරු කිහිපයකම ප්‍රදර්ශනය කර තිබුණි. එය ඡායාපිටපත් කිරීමේදී වැඩිපුර තීන්ත තැවරීම නිසා දැන්වීම අපැහැදිලි විය.

1) මෙම තත්වයට අදාල සන්නිවේදන ආකෘතිය නම් කරන්න. (1)

2) සංදේශයක් අසාර්ථක වීමට හේතුවන බාධක නම් කරන්න. (2)

3) දැන්වීම් පුවරුවේ නිවේදන ඇලවීම විධිමත් සන්නිවේදන අවස්ථාවකි. විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාර තුනක් නම් කර ඉන් ඒක අවස්ථාවක් පැහැදිලි කරන්න. (3)

4) ත්‍යාග හිමි ආදී ශිෂ්‍යයන්ට ඒ පිළිබඳව විද්‍යුත් තැපැලෙන් දැන්වීම සුදුසු යයි යෝජනා විය, විද්‍යුත් තැපැල භාවිතයේ වාසි හතරක් කෙටියෙන් විස්තර කරන්න. (4)

5. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුල මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය යන මාධ්‍ය ත්‍රිත්වයෙන්ම බහුජන මාධ්‍ය ක්‍රියාත්මක වේ.

1) මුද්‍රිත මාධ්‍යක් වන පුවත්පත් එහි හිමිකාරිත්වය අනුව ප්‍රධාන කොටස් දෙකකට බෙදා වෙන් කල හැකිය.එම හිමිකම් ප්‍රභේද දෙක මොනවද ? (1)

2) රාජ්‍ය සංස්ථාවක් ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ප්‍රධාන විධායක කවර නමකින් හැඳින්වේද ? පෞද්ගලික සමාගම් ලෙස ක්‍රියාත්මක වන විට එම තනතුර හඳුන්වන්නේ කෙසේද ? (2)

3) මාධ්‍ය ආයතනයට සම්බන්ධ ප්‍රධාන මාධ්‍ය ශ්‍රමිකයින් වර්ග දෙක නම් කරන්න, ඉන් ඒක ශ්‍රමිකයෙක් පිළිබඳ පැහැදිලි කරන්න. (3)

4) ජනමාධ්‍ය සම්බන්ධ කරගෙන තම ස්ථාවරය රැකගැනීමට ඕනෑම රජයක් උත්සහ දරනු ලැබීම සාමාන්‍ය සවභාවයකි ඒ අනුව රජයකට තිබිය හැකි ප්‍රධාන අරමුණු 4 ක් කෙටියෙන් විස්තර කරන්න. (4)

6. "සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම ප්‍රධාන පෙළේ පෞද්ගලික සමාගමකි"

1) ඉහත ප්‍රකාශයට ඔබ එකඟවන්නේද ? ඔබගේ පිළිතුරට හේතුවක් දක්වන්න. (1)

2) "කලු ලෑල්ල සාර්ථක පන්ති කාමර මාධ්‍ය උපකරණයකි "ඉහත ප්‍රකාශයට ඔබ එකඟවන්නේද ? ඔබගේ පිළිතුරට හේතු දෙකක් දක්වන්න. (2)

3) "අන්තර් පුද්ගල සන්නිවේදනය සාර්ථක වීමට නිර්වාචික සන්නිවේදනය උපකාරීවේ" ඉහත ප්‍රකාශයට ඔබ එකඟවන්නේද ? ඔබගේ පිළිතුරට හේතු දෙකක් දක්වන්න. (3)

4) "ජංගම දුරකථනය බහුවිධ උපකරණයකි". ඉහත ප්‍රකාශයට ඔබ එකඟවන්නේද ? ඔබගේ පිළිතුරට හේතු හතරක් දක්වන්න. (4)

7. A → B → C → D → E

1) ඉහත සංකේත මගින් හැඳින්වෙන ආකෘතිය නම් කරන්න. (1)

2) A, B, C, D, E අකුරු මගින් දැක්වෙන සන්නිවේදන මූලිකාංග නම් කරන්න. (2)

3) E අකුරෙන් හැඳින්වෙන මූලිකාංගය නම් කර එය කෙටියෙන් විස්තර කරන්න . (3)

4) මෙම ආකෘතිය හා ෂැනොන්විවර්ගේ ආකෘතිය අතර ඇති වෙනස්කම් හා සමානකම් පැහැදිලි කරන්න. (4)